# සැලී සහ ඇන්ගේ පාසල් කාලය




හසරංගී හේරත්

# සැලී සහ ඈන්ගේ පාසල් කාලය

හසරංගි හේරත්

මහ/ මහමායා බාලිකා විදුහල

7 ශ්‍රේණිය C

කතාව සහ චිත්‍ර

හසරංගි හේරත්

ISBN –
978-624-211-452-1

කෘතිය පළ කරන දින

2026.06.02

කතෘ ප්‍රකාශනයකි

2026

# පිදුම

මට අකුරු කියා දී ජීවිතය කියාදෙන

මගේ ආදරණීය ගුරුතුමා / ගුරුතුමිය ඇතුළු

මාව මේ තත්ත්වයට ගෙන ආ

මගේ ආදරණීය අම්මාට සහ තාත්තාට

භක්ති පූර්වකව පුද කරමි

## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරණ හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය හඳුන්වා දිය හැකිය. දශකයකට අධික කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශාල ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලිවීමට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේත කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණකි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන්වූ ගුරුවරුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දරු දැරියන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාළිගාව

2026.05.10

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයා වශයෙන් සුභාශිංසන පණිවුඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි. අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# පටුන

01. සාමාන්‍ය පෙළ විභාගය

02. අලුත් පංතිය

03. සැලීගේ හොඳම යාළුවා

04. ශිෂ්‍ය නායිකා මණ්ඩලය

05. සැලීගේ තවත් යාළුවෙක්

06. සැලීයි ඇනුයි තරහ වෙලා

07. අලුත් ගුරුතුමී

08. වැසි කාලය

09. පංතියේ පළවෙනියා කවුද ?

# සාමාන්‍ය පෙළ විභාගය

එක මත් එක කාලෙක හිටියා සැලී කියලා පුංචි ගැහැණු ළමයෙක්. ඇය හරිම දුප්පත් ළමයෙක්. සැලී යන්නේ ගමේ පාසලට. ඇය හරිම දක්ෂයි. ඉතින් ඔන්න ඔහොම ටික කාලයක් ගියාට පස්සේ පාසල් සාමාන්‍ය පෙළ විභාගයත් ආවා. සැලී විභාගෙ ලියලා ඇවිල්ලා අම්මට කිව්වා “ අම්මේ මං විභාගෙන් සමත් වෙයි ද ” කියලා. අම්මා කිව්වා “ බයවෙන්න එපා දුවේ. ඔයා හොඳින් විභාගයට මුහුණ දුන්නානේ ඒ නිසා ඔයාට හොඳ ප්‍රතිඵලයක් ඒවි ” කියා අම්මා සැලීට කිව්වා. සැලී එය අසා සතුටින් කාමරය දෙසට දිව ගියා. ටික ටික දවස් ගෙවී ගියා. විභාග ප්‍රතිඵලත් ආවා. සැලී සතුටින් පාසලට ගියා. සැලී පාසලට ගොස් උදය රැස්වීමේ හිට ගත්තා. විදුහල්පතිතුමිය පැමිණ සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල කීම ආරම්භ කලා. විදුහල්පතිතුමිය සැලීගේ ප්‍රථිපලය කීවා. සැලී පාසලේ ප්‍රථම ස්ථානය සහ මුළු දිවයිනෙන් 3න් වන ස්ථානය. එය කීමත් සමඟ ශිෂ්‍යාවන් සියලු දෙනාම වේගයෙන් අත්පොලසන් දුන්නා. සැලීට සියලුම විෂයන් සඳහා A සාමාර්ථ තිබුණා. සැලීට ගොඩක් සතුටු හිතුණා. සැලීට සතුට වැඩි කමට සතුටු කඳුළු වැටුණා.

පාසල් නිම වූවායෙන් පසු සැලී සතුටින් සහ වේගයෙන් නිවසට පියමන් කලා. මව ද ඒ සමඟ නිවසේ දොර අසලට පැමිණියා. “ සැලී මොකද දුවේ මෙච්චර සතුටින්.” මව පැවසුවා. “අම්මේ මම තමයි ඉස්කෝලේ පළවෙනියා. ඒ වගේම ලංකාවේ 3 න් වෙනියා අම්මේ.” අම්මා අඬමින් මෙසේ පැවසුවා. “මගේ දුවේ, මගේ රත්තරන් දුවට බුදුසරණයි. කවදාවත් වරදින්නෑ දුවේ ඔයාට.” සැලීව පාසලේ ඇගයීමකටත් ලක් කලා. විදුහල්පතිතුමිය සැලීව දැකලා මෙහෙම කිව්වා. “මගේ දයාබර දියණියනි ඊළඟට තිබෙන උසස් පෙළ විභාගයත් ලියලා ඔයාලා සියලුදෙනාම හොඳින් සමත්වෙන්න ඕනේ  අපේ සැලී දුව වගේ. අපිට පුංචි දුකක් තියෙනවා. ඒ තමයි සැලී දුව අද තමයි අපේ පාසලට එන අවසාන දවස. ඇය නගරයේ උසස් පාසලකට යනවා.” දුවේ ඔයාට සුබ අනාගතයක්. කියා විදුහල්පතිතුමිය කිව්වා. සැලී නිවසට ගොස් අලුත් පාසලට යන්න සූදානම් වුණා.


O/L

# අලුත් පංතිය

සැලි සාමාන්‍ය පෙළ විභාගය සමත්වෙලා නගරයේ තිබෙන විශාලතම පාසලට ගියා. පළමු දවසේම පාසලට ගොස් පන්තියට ගියා. සැලිගේ පන්ති භාර ගුරුතුමිය පංතියේ නාම ලේඛනය ලකුණු කරමින් සිටියේ.

සැලී පන්තියේ දොරට තට්ටු කරලා '' එක්ස්කියුස්මි මැඩම් '' කියා පන්තියේ ඇතුලට ගියා පන්තිභාර ගුරු තුමිය සැලීට පන්තියේ ඇතුලට එන්න අවසර දුන්නා. පන්තිභාර ගුරුතුමිය ''එන්න පුතේ ඇවිත් වාඩිවෙන්න '' කියා සැලීට කිව්වා. සැලී ඇවිල්ලා පන්තියේ ඉස්සරහින්ම වාඩි වුණා. සැලීගේ දෙමව්පියෝ සැලීව පන්තියට දාලා ගෙදර ගියා.

ගුරුතුමිය සැලිව පංතියේ ඉස්සරහට ගෙන්නුවා. ගුරුතුමිය සැලිට කිව්වා " හරි ඔය දරුවාගේ විස්තරය කියන්න බලන්න" සැලි තමන්ගේ නමේ ඉදන් විස්තර ටික කිව්වා. සැලි විස්තර ටික කියලා පන්තියේ වාඩි වුණා.


12-C
12
+ 21
33
A+
I
am
com
in

# සැලීගේ හොඳම යාළුවා

සැලී පංතියට ආවා. ඇවිල්ලා වාඩි වුණා. සැලීට එහා පැත්තෙන් හිටියේ හොඳට ඉගෙන ගන්න පුලුවන් දක්ෂ ගැහැණු ළමයෙක්. සැලි එයාට කතා කළා. ඇයගේ නම ඇසුවා. ඇය “ හායි.... මගේ නම සැලී ඔයාගේ නම මොකද්ද? ” අර ළමයා කිව්වා “ හායි.... මගේ නම ඈන් ” කියලා ඔන්න ඔහොම ගියාට පස්සේ සැලි ඈන්ගෙන් ඇහුවා “ ඈන් අපේ පන්ති භාර ගුරුතුමියගේ නම මොකද්ද” කියලා. ඈන් කිව්වා “ සැලි අපේ පන්ති භාර ගුරුතුමියගේ නම මොනාලිසා මිස්. ඔයාට ඒ නම ඉක්මනට අමතක වේවි. ” දෙන්නම විවේක කාලයේදි ආහාර ගෙන ඉන් පසුව කාලච්ඡේද වලදි ඉගෙන ගත්තා.



Shcool
6A 6B 6C 6D 6E 6f 6G 6H GJ
7A 7B 7C 7D 7E 7f 7G 7H 7I
8A 8B 8C 8D 8E 8f 8G 8H 8I
9A 9B 9C 9D 9E 9f 9G 9H 9I
ga
te


# ශිෂ්‍ය නායිකා මණ්ඩලය

"සුබ උදෑසනක් ඈන්". "සුබ උදෑසනක් සැලී" කියා දෙන්නටම කියා ගත්තා. ඈන් සැලීගෙන් ඇහුවා, "සැලී ඔයා ශිෂ්‍ය නායිකා තේරීමේ වැඩ සටහනට යනවද?" කියලා. සැලී කිව්වා, "මම නම් යනවා." ඔයා යනවද ඈන් ? කියලා ඈන්ගෙන් ඇහුවා. ඈන් ඊට පස්සේ සැලී අහපු ප්‍රශ්නයට උත්තර දුන්නා. "ඔව් මම අනිවාරෙන්ම යනවා." කියා ඈන් උත්තර දුන්නා.

3 වන කාලච්ඡේදය ආරම්භ වුනා. 'ටින්, ටින්' ගා සීනුවෙන් නාද වුනා. ඒ නාද වුනේ ඒ පාසලේ නිවේදන සීනුවයි. නිවේදනය නිකුත් වුනා. එම නිවේදනයෙන් සඳහන් වුනේ 2026 වර්ෂයේ නව ශිෂ්‍ය නායිකා මණ්ඩලයට බැදෙන්න කැමති සියලු දෙනා දැන් පුස්තකාලයට පැමිණෙන්න කියා විදුහල්පතිනිය නිවේදනය කිරීමයි. සැලී, ඈනුයි පුස්තකාලයට ගොස් එම විභාගයට මුහුණ දුන්නා.

දින 3 අවසන් වුනා. 2026 වර්ෂයට අදාලව නව ශිෂ්‍ය නායිකා මණ්ඩලයේ ප්‍රතිඵල නිකුත් කිරීමේ සහ නිල ලාංඡන පැළඳවීමේ උත්සවය තිබිය යුතු දිනය පැමිණියා. විදුහල්පති තුමිය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායිකා මණ්ඩලයේ සිටින නිවාස නායිකාවන්, නිවාස උප නායිකාවන් සහ , නව ශිෂ්‍ය නායිකාවන් පත් කලා.

සැලීයි, ඈනුයි බය වුනා. ඈන් සැලීට කිව්වා '' අපි දෙන්නාට කිසිම ස්ථානයක් නැද්ද කොහෙදො කියද්දීම. ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලය පත් කලා.'' ප්‍රධාන ශිෂ්‍ය නායිකාව සැලී තෝමස්, උප ප්‍රධාන ශිෂ්‍ය නායිකාව ඈන් විල්බට්. දෙන්නා හරි සතුටින් උඩ පැන්නා. ඈන් කෑ ගැහුවා සැලීටයි, ඈන්ටයි අනිත් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායිකා මණ්ඩලයටයි නිල ලාංඡන පැලද සියලු දෙනාම පන්ති කාමර වෙත පියමන් කලේය.


2026
Prefect board
2026
Sali Thomas...
head prefect

# සැලීගේ තවත් යාළුවෙක්

සැලී උදෑසනින්ම පන්තියට පැමිණියා. සැලී පන්තියට පැමිණ වට පිට බැලුවා. සැලී දැක්කා අෑන් අද පාසල් පැමිණිලා නැති බව. සියලු දෙනාම ආගමික වතාවත් වල නිරත වී ශරීරි සුවතාවල නිරත වුණා. පන්ති භාර ගුරුතුමිය වන නැන්සි මිස් පන්තියට පැමිණියා. ඇය නාම ලේඛනය ලකුණු කළාට පසුව සියලු දෙනාම ඉගැන්වීමේ කටයුතු වලට සූදානම් වුණා. විනාඩි 3 ක් ගත වුණාට පසුව පන්තියට අලුත් ළමයෙක් පැමිණියා. පන්ති භාර ගුරුතුමිය ඇය ආදරයෙන් පිළිගත්තා.

ඇයට වාඩි වීමට ස්ථානයක් නොමැති නිසා ඇය සැලී අසලින් වාඩිවුණා. කාලච්ඡේද 4 ක් ගත වූ වායෙන් පසුව විවේක කාලය එළඹුණා සැලී අලුතින් පැමිණි ශිෂ්‍යාවගේ නම විමසුවා. එය විමසුවේ මෙසේය "හායි ඔයාගේ නම මොකද්ද?" මගේ නම ඇලන්. "එතකොට ඔයාගේ නම මොකද්ද?" මගේ නම සැලී තෝමස්." ඇලන් සැලීගෙන් ඇහුවා "මේ මිස් ගේ නම මොකද්ද" කියලා. සැලී කිව්වා "ඒ මිස් ගේ නම නැන්සි මිස් කියලා." ඉන් පසුව යාළුවෝ දෙන්නා පාසල් නිමාවූවාට පසු නිවෙස් කරා පියමන් කළාය.


පාසල
10 A 10B 10C 10D 10E 10G 10f
11A 11B 11C 11D 11E 11G 11f
12A 12B 12C 12D 12E 12G 12f
13 A 13 B 13C 13D 13E 13 G 13f
1A 1B 1C 1D 1E 1G 1f

# සැලීයි ඇනුයි තරහ වෙලා

සැලී පාසලට පැමිණියා. සැලී පන්තියට ගොස් පන්තිය දෙස බැලුවා. පන්තියේ සැලී අසුන් ගන්නා ස්ථානයේ ඈන් පැමිණ වාඩි වී සිටියා. සැලී පැමිණ "ඔයා මෙතනද ඉන්නේ" කියා ඈන්ගෙන් ඇහුවා. ඈන් "ඔව් මං වෙනදාත් මෙතනනේ ඉන්නේ." කියා ඈන් සැලීට කිව්වා. ටික කාලයක් ගත වූ වායෙන් පසු ඇලන් පන්තියට පැමිණියා. ඒ වෙලාවේ සැලි එතැන හිටියේ නෑ. ඇලන් ඇවිල්ලා "ඒ ඔයා කවුද මමයි ඔතන ඉන්නේ. මම තමයි සැලීගේ හොඳම යාළුවා" කියා ඈන්ට තරහ හිතින් කිව්වා. සැලී ඒ අසලට පැමිණියා. ඈන් සැලීට මෙහෙම කිව්වා. "සැලී මෙයා මොනවාද මේ කියවන්නේ" කියා ඈන් කිව්වා. සැලී කිව්වා "අනේ ඈන් වැරදියට හිතන්න එපා. මෙයා ඊයේ අලුතින් ආවේ. ඊට පස්සේ මෙයා මෙතනින් වාඩි වුණා.

මෙයා මගෙන් ඇහුවා එයාගේ හොඳම යාළුවා වෙන්න පුළුවන්ද කියලා. මට බෑ කියන්න බැහැනේ. '' ඒකයි සැලී කිව්වා. ඈන් එතනින් වචනයක් වත් නොකියා යන්න ගියා. ඒ දෙන්නා දවසම තරහ වුණා.


School Play ground

# අලුත් ගුරුතුමා

පාසල ආරම්භ වී විනාඩි 20 ක් ගත වුණා. සැලීගේ පන්ති භාර ගුරුතුමිය විශ්‍රාම දිවියට පා තබන දවස ලං වුණා. එම දවස අදයි. පාසලේ සිටින ශිෂ්‍යාවන් සියලු දෙනාම පාසලේ ප්‍රධාන ශාලාවට පැමිණ අසුන් ලබා ගත්තා. විනාඩි 2කට පසුව විදුහල්පතිතුමිය ප්‍රධාන ශාලාවට පැමිණ අසුන් ගත්තා. සියලු දෙනාම නැගිට ආගමික වතාවත් වල නිරත වූ වායෙන් පසු නැවතත් අසුන් ගත්තා. උත්සවයේ නිවේදන කටයුතු කරනා ශිෂ්‍යාවන් දෙපළ වේදිකාවට පැමිණියා.

උත්සවයේ පිළිගැනීමේ කථාව ඉදිරිපත් කිරීමට තිබුණේ පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකා සැලී තෝමස් ශිෂ්‍ය නායිකාවටයි. සැලී වේදිකාවට පැමිණ ඇගේ කථාව නිම කලා, සැලී කථාව නිම කර වේදිකාවෙන් බැස ගියාය. සැලී දුටුවා, විදුහල්පතිතුමියගේ දෑස් වලින් කඳුළු වැටෙන අයුරු. සැලී විදුහල්පතිතුමිය ළඟට ගොස් එතුමියගෙන් මෙසේ විමසුවා. "මැඩම් මොකද මේ ඇස් වල කඳුළු" කියා සැලී විමසුවා. විදුහල්පතිතුමිය "නෑ මගෙ දුවේ හරි ලස්සනයි කථාව. මට හරි ආඩම්බරයි." කියා විදුහල්පතිතුමිය පිළිතුරු දුන්නා.

උත්සවය නිමවීමට කාල වේලාව පැමිණියා. දැන් තිබෙන්නේ ස්තූති කථාවයි. ඒ සඳහා ආරාධනා කලේ විද්‍යාලීය ගරු විදුහල්පතිතුමියටයි. විදුහල්පතිතුමිය වේදිකාවට ගොස් කථාව නිම කළා. තවත් අලුත් ගුරුතුමියන් හඳුන්වා දුන්නා. ඒ එස් නැන්සි රොබින්. සියලු දෙනාම මිස් නැන්සිව හඳුනා ගත්තා. සියලු දෙනාම මොනාලිසා මිස්ට සුභම සුභ විශ්‍රාම දිවියක් වේවා කියා ප්‍රාර්ථනා කර පන්ති වලට ගියා. සැලීගෙයි ඇන්ගෙයි පන්ති භාර ගුරුතුමිය වුණේ අර අලුතින් ආව නැන්සි මිස්. සියලු දෙනාම අසුන් වලින් නැගිට ගුරුතුමියව සුහදව පිළිගත්තා. මිස් නැන්සිගේ දුව වන ඇලන් රූබින් යන ශිෂ්‍යයාව සිටින්නෙත් ඇයගේ පන්තියෙමයි. සියලුම ශිෂ්‍යාවන් ඇයත් සමඟ සතුටින් අප පාසල් වැඩ සහ අධ්‍යාපන සියලුම වැඩ සතුටින් කළාය.


WE
LC
O M
E

# වැසි කාලය

සැලී නිවසේ  දි ඈන්ට කතා කලා. ඈ කතා කලේ සවස 3.30 ට පමණ. එවිට ඈන්ට නින්ද ගොස් සිටියේ. ඈන්ගේ මව ඈන්ව ඇහැරෙව්වා. '' ඈන් නැගිටින්න ළමයෝ. අර ඔයාගේ යාළුවා සැලී කතා කරනවා. '' ඈන් ගොස් දුරකථනය අතට ගත්තා. සැලී ඈන්ට කිව්වා '' වැස්ස නිසා ස්කොලේ නිවාඩුනේ. අපි ඒක හින්දා යමුද පාක් එකට '' කියා සැලී කිව්වා . ඈන් කිව්වා '' හා හා අපි යමුකෝ හැබැයි මට වැස්සේ පොඩ්ඩක් සෙල්ලම් කරන්න ඔනේ '' කියලා. සැලී හා කියා දෙන්නම පාක් එකට ආවා.

ඇවිල්ලා දෙන්නම සවස 05 පමණ වෙනකල් පාර්ක් එකේ හිටියා. දෙන්නා වැස්සේ හොඳටම සෙල්ලම් කලා. ඒ විතරක් නෙමෙයි බෝට්ටුත් යැව්වා.



# පංතියේ පළවෙනියා කවුද ?

පන්තියේ වාරය අවසාන වාර විභාගය ආවා. සැලී ඈනුයි පන්තියට පැමිණ විභාගයේ විෂයන් පාඩම් කලා. සැලී නම් හොදට පාඩම් කලා. හැබැයි ඈන් නම් පාඩම් වලට කමම්ැලි. මේ සැලී ගේ පළවෙනි වාර විභාගය. සැලී එන්න කලින් ඈන් තමයි පන්තියේ පලවෙනියා. එක නිසා ඈන් සැලීට කිව්වා '' මට පාඩම් කරන්න ඕන නෑ ගිය සැරෙත් මන් පන්තියේ පළවෙනියා කිව්වා '' සියලු දෙනාම වාර විභාගය ලිව්වා . ලියා නිවෙස් වෙත ගියා. පසු දා ලකුණු වාර්තාව දුන්නා. ඈන් අඩන්න පටන් ගත්තා. සැලීට නන් හරි සතුටුයි. සැලි පන්තියේ පලවෙනියා. ඈන් පන්තියේ අන්තිමයා. සැලී ඈන්ට ඇවිල්ලා කිව්වා '' දුක් වෙන්න එපා මහන්සි වෙලා වැඩ කරන්න. ඊලග පාර ඔයාට පන්තියේ පළවෙනියා වෙන්න පුලුවන් කියා '' සැලී කිව්වා. එදා ඉදන් දෙන්නම හොඳට වැඩ කළා.


Last place

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

# ස්තුතිය

මට මේ පොත හොා්දින් සහ ලස්සනට ලියන්න කියා දුන් මාගේ
දෙමාපියන්ටත් ගුරුවරුන්ටත් මාගේ සහෝදරයන්ටත් ඒ වගේම මගේ
යාළුවන්ටත් අනෙකුත් සියලුම දෙනාටත් මාගේ හද පිරි

ස්තුතිය පුද කරමි.

සියළු දෙනාම රස විදින්න......


| | | |
|---|---|---|
| කතෘ | - | හසරංගි හේරත් |
| ලිපිනය | - | නො 83/1, විල්අමුණ, තෙල්දෙණිය |
| දුරකථන අංකය | - | 078 81 97 965 |